RARE

නිබන්ධය

# ශ්‍රී ලංකාවේ ජන නාට්‍ය කලාව හා සන්නිවේදනය.

(දයානන්ද ගුණවර්ධනයන්ගේ නරිබෑනා නාට්‍ය පිළිබඳව අධ්‍යයනයක්.)

ඉදිරිපත් කරනු ලබන්නේ

ඩබ්.එම්.ආර්.එල්. ආරියරත්න

(FGS/M/MSSc/2003/04)

ප්‍රවේශ අංකය: 1247
වර්ග අංකය:

සමාජීය විද්‍යාපති (ජනසන්නිවේදනය) උපාධියෙහි අවශ්‍යතාවක් පුරණය කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

මැයි 2015

# සංක්ෂේපය

ජන සම්ප්‍රදායික කලාවන්ගේ සන්නිවේදන පෞරුෂය අති ප්‍රබල වූවකි. ඒ අතරින් ජන නාට්‍ය නම් වූ කලාංගය සෙසු ජන කලාවන්ද එක්තැන් කර ගනිමින් ඉදිරියෙන් වැජඹෙන සුවිශේෂ වූ කලාංගයකි. ජන නාට්‍ය තුල පවතින ප්‍රබල සන්නිවේදන ශක්‍යතාවය විවිධ නිදසුන් මගින් මෙහිදී අනාවරණය කෙරෙයි. ඒ ඔස්සේ දයානන්ද ගුණවර්ධනයන්ගේ නරිබෑනා නාට්‍ය පදනම් කරගනිමින් ජන නාට්‍ය හා සන්නිවේදනය පිළිබඳව නිබන්ධන විමර්ශනය සිදු කෙරී ඇත.

ජනශ්‍රැතිකාංග තුළ පවතින නිර්මාණාත්මක සන්නිවේදන භාවිතයන් දයානන්ද ගුණවර්ධනයන්ගේ නරිබෑනා වැනි නව නාට්‍ය නිර්මාණයන්ට භාවිතා කර ඇති අයුරු මෙම නිබන්ධනයේ අන්තර්ගතව ඇත . ජන කතා, ජන නැටුම්, සවුදම්, රබන්පද වැනි ජනශ්‍රැතිකාංග ජන නාට්‍ය පෝෂණය සඳහා ඉතා මටසිලිටු ලෙස දයානන්ද ගුණවර්ධනයන්ගේ භාවිතාව නිබන්ධන විමර්ශනයේ ගැබ් වී ඇත.

නූතන කලා අභිමුවේ ජන නාට්‍ය යනු පසෙක දැමිය යුත්තක් නොව නූතන කලාවත් නූතන නාට්‍යයත් පෝෂණයට භාවිතා කල හැකි අපූර්ව සන්නිවේදන මාධ්‍යයක් ලෙස ජන නාට්‍යයත් නරිබෑනා නාට්‍යයත් නිදසුන් සහිතව මෙහිදී පෙන්නුම් කෙරේ. ජන නාට්‍යය නූතන වේදිකාව මතට නිර්මාණශීලීව රැගෙන ඒමේ කාලෝචිතභාවය සහ නාට්‍ය කලාවේ අනාගත අභිවෘද්ධියට එය දායක වන අන්දම මෙම නිබන්ධනයේ ගෙනහැර දක්වා ඇත.

දයානන්ද ගුණවර්ධනයන්ගේ නාට්‍ය භාවිතාව දෙස බලන විට එතුමා ජන සම්ප්‍රදායේ ආභාසය ලබා ජන මනස පුබුදු කිරීමට නාට්‍ය කලාව භාවිතා කර ඇති අයුරු පෙන්වා දීමට නරි බෑනා නාට්‍යයේ නිදසුන් භාවිතා කරමින් ජන නාට්‍යයේ ක්‍රමික විකාශනය නූතන වේදිකාවේ දක්වන සන්නිවේදන පෙළහර දක්වා ආශ්‍රිත විෂයානුබද්ධ න්‍යායික සහ ප්‍රායෝගික භාවිතයන් ඇසුරු කරගනිමින් නිබන්ධනය සිදු කෙරී ඇත. විවිධ නාට්‍යකරුවන් , ප්‍රේක්ෂකයින් ,ජනශ්‍රැති විශේෂඥයින් සහ විවිධ සම්පත්දායකයින් සමඟ පවත්වනු ලද සම්මුඛ සාකච්ඡාද නිබන්ධනයේ පෝෂණයට බොහෝ සේ දායක විය.

ශාන්තිකර්ම තුළ අන්තර්ගත වූ අනුකරණය සහ සමාරෝපය යන නාට්‍ය අංගයන්ගෙන් ඇරඹෙමින් නරිබෑනා වැනි නූතන නාට්‍ය දක්වා ජන නාට්‍යයේ විකාශනය අන්තර්ගතය. සර්ව කාලීන සර්ව භෞමික වටිනා කමකින් යුත් උසස් නිර්මාණ බිහිකර ගැනීමට ජනශ්‍රැති අවශ්‍යතාව අතිශයින් වැදගත් වේ. ජන සම්ප්‍රදාය පදනම් කර ගනිමින් නූතන සම්ප්‍රදායන් සමඟ සම්මිශ්‍ර වෙමින් ජනතා ඥාණනය සඳහා උසස් වින්දනයක් ලබාගැනීමට ඇති නිර්මාණ බිහිකර ගැනීමේ අභිලාෂය මුදුන් පත් කරගැනීම යන කරුණ නිබන්ධනය සාරාංශ කොට දැක්වීමක් ලෙස දැක්විය හැකිය.

ඉඟිපද :- "**ජනශ්‍රැතිය**","**අනුකරණය**","**සමාරෝපය**","**ජනසම්ප්‍රදාය**","**සාමූහික විඥානය**"

## Abstract

Summary

Folk arts are an influential medium of communication. Folk drama stands out among them as it brings together most other forms of folk arts. This thesis illustrates the communicative strength of these forms of art, based on the stage play *Naribena* by Dayananada Gunawardhana. It explores the seamless creative adaptation of features of folk art forms such as stories, dances, *saudam,* and *raban pada* into making a modern drama. Thereby, this exploration exemplifies how folk art can enrich the modern day art and drama. The present study also looks at the resilient nature of folk art forms to survive tides of change and emerge in modern day art.

The study is based on analysis of the artwork *Naribena* and interviews with folklore experts. It also looks at the evolution of folk drama from mimicry and assimilation manifest in healing rituals to modern forms of drama such as *Nari Bena.*

In conclusion, the thesis argues that folk forms of art can be vital in making drama theatrical performances universal. It illustrates how folk art forms play an important communicative role in theatre as they mix easily with modernity, thereby making tasteful art possible.



**Keywords: folklore, mimicry, folk traditions, collective consciousness**